# මල්වත්තේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සංඝ සමාජය



මුර දේවතාවුන් ගැන කතා කිරීම බෙල්ල ගහලා යන වැඩක් නිසා කන් දෙක සුද්ද කරගෙන සිටියත් මට බැණුම් අහන්නට නොලැබිණි. කතා කළ එකම පුද්ගලයා මටත් ගුරුහරුකම් දෙන ජ්‍යෙෂ්ඨයෙකි. මල්වත්තේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කිව්වොත් නරකදැයි කියා යට ගියාව මතක් කර දෙන්නටත් ඔහු සමත් විය.

මේ ලියන්නේ මා නොදත් බොහෝ දේ ඔහුගෙන් අසා ගත්තාට පසුව ය.

මල්වත්තේ මහ නා හිමියන්ටත් අස්ගිරියේ මහ නා හිමියන්ටත් හිටි හැටියේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදය රැක ගැනීමේ චේතනාව පහළ වූයේ ඒ දවස් වල වැව රවුමේ ඔබ මොබ යමින් වරින් වර මල්වත්තටත් ගොඩ වුණු කොළඹ රටේ ධනවතුන්ගේ පරිත්‍යාගශීලී භාවය නිසාද යන ප්‍රශ්නය කිහිප දෙනෙක්ම මතු කළහ. නිච්චියටම නොදැන එහෙම කතන්දර තහවුරු කරන එක හරි නැත. පරණ සිද්දි ගැන කලින් ලිපියෙන් සඳහන් කළෙමි.

සද්ද බද්ද කර දළදා මැදුර අබියස පවත්වන්නට ගිය මහා සංඝ සභාව යටපත් ව ගියේ රජයේ තරවටු නිසා යයි සමහරුන් කීවත් ඊට වඩා සියුම් අභියෝගයක් සංඝයා වහන්සේලාගෙන්ම ඉදිරිපත් වූ බව තවත් පැත්තකින් කියවෙයි. මා කියන්නට යන කතන්දරය නම් ඒ කියන අභියෝගයට කෙළින්ම සම්බන්ධ වන්නේ ය.

කතන්දරයට කලින් පරණ කතාවක් කීම උචිත ය. මෙදා පාර රාජපක්ෂ රජයට ප්‍රජාතන්ත්‍රවාදය කියා දෙන්නට සිතූ මහානායක හිමියන්දැයි හරියටම කිව නොහැකි ය. කොහොමටත් ත්‍රෛනිකායික මහා සංඝයා වහන්සේ පිරිසක් සමසමාජ නායක ආචාර්ය කොල්වින් ආර් ද සිල්වාට දේශපාලන පාඩමක් කියා දෙන්නට තීරණය කළෝ ය. එහෙම තීරණය කර ඔහු මුණ ගැසී එදා දවසේ ජාතික අවශ්‍යතාව පෙන්වා දීමට සිතූහ. එදා අවශ්‍ය යයි උන්වහන්සේලා සිතුවේ වමේ පක්ෂ වල එකමුතු කම ය. එකිනෙකා සමග ගැටෙන්නේ නැතිව එකමුතුව වැඩ කළහොත් රටට සුබ අනාගතයක් උදා කළ හැකි බව පෙන්වා දුන්නේ මෙත් සිත පෙරදැරි කරගෙන බව පැහැදිලි ය. කතාවට වාගේම සවන් දීමටත් එක් බඳු සමත්කමක් පෑ ආචාර්ය ද සිල්වා ඇසි පිය නොහෙලා බලා සිටියේ අර කියන හැම වචනයක්ම සිත්හි ධාරණය කරගනු පිණිස ය. ඒ ශ්‍රවණය වූ කලී ශ්‍රද්ධාවන්ත බෞද්ධෝපාසකයකුගෙන් කලාතුරකින් දකින්න ලැබෙන විදියේ අවධානයක්ද සහිත වූවකි.

ඊළඟට උත්තර දීම ය. එතැන දී සැදැහැවත් බොදුනුවා යට පත් කර ගෙන නැගී සිටියේ නීති විශාරද ආචාර්ය ද සිල්වා ය. නීති විශාරදයාගේ තර්ක බිඳින්නට රුසියකු මේ සිරිලකේ නැති බව දත් භික්ෂූන් වහන්සේ ඔහු කියන කතාව අසා සිටිනවා හැර අන් කළ හැකි දෙයක් නැති බව වටහා ගත්හ.

එය තර්කානුකූලය. සිරිත් පරිදි කොල්වින් පටන් ගත්තේ හාමුදුරුවන් කී දේට එකඟ වීමෙනි.

***<u>කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලය එන විට මහනුවර රජගෙදර තුළත් හින්දු බලපෑම් අධිකව පැවතියේ නායක්කාර් වංශිකයන් එහි මුල් බැස ගෙන තිබුණු නිසා ය. භික්ෂූන් කියා පිරිසක් නොසිටි තරම් ය. එවක සිවුරු දරා ගෙන සිටියවුන් හඳුන්වනු ලැබුවේ ද ගනින්නාන්සේ නමින් ය.</u>***

-එහෙම වුණාත් මෙහෙම දෙයක් තියෙනවා නේ ස්වාමීන් වහන්ස. අපි අපේ වයිවාරන්න මාර්ග වලින් යන්න උත්සාහ කරන්නේ එක ම තැනටයි. සමාජවාදී සමාජයක් දකින්නයි. ඒකට යන්න නොයෙකුත් මාර්ග විධි ක්‍රම තියෙනවා. අපි අපේ විශ්වාසය අනුව අපට සුදුසු මාර්ගය - උපක්‍රමය යොදා ගන්නවා. අප අතර ගැටීමක්, මතභේදයක් තියෙන්නේ යන මාර්ගය ගැනයි. ඒ නිසා තමයි අපි එකිනෙකා විවේචනය කරන්නේ. ඒක දේසපාලනේ ලක්ෂණයක්. වයිරක්කාරකමක් නෙවෙයි.

අපි දැන් ටිකක් ඔබ වහන්සේලා බාර අරන් තියෙන රාජකාරිය ගැනත් කතා කරමු. මේ මං දන්න විදියටයි. ඔබ වහන්සේලා සියලු දෙනාම බුදු හාමුදුරුවන් කියා දීපු පාරේ යන්න ගිහියන්ට උපදෙස් දෙනවා. හැම කෙනෙක්ම අවසානයේ නිවන් දකිනවා. ඒ කියන්නේ අරමුණ එකයි. ඔතෙන්ට යන පාරත් එකයි. මං හිත්නනේ ආර්ය අශ්ටාංගික මාර්ගය විතරයි තියෙන්නෙ. ඔය පාර කියා දෙන්න අපි වගේ පිල් බෙදිලා කරන්න ඕනෙ නැහැ නේද? සේරම සංඝයා වහන්සේලා අනුශාසනා කරන්නේ එකම දේ නේද? ඉතින් දැන් අපේ රටේ තියෙන නිකාය භේදය ඔය වැඩේට අවශ්‍ය නැහැ නේද? සේරම එකතු වෙලා එකම නිකායක් වෙන එක නේද හොඳම ක්‍රමය?"

කොල්වින් කතාව හමාර කළේ ය. හාමුදුරුවෝ තුෂ්ණිම්භූතව බලා සිටිති. ඒ නිහැඬියාව බින්දේ ද නීති විශාරදයා ය. "එහෙම නම් අවසර" කියා උන් වහන්සේලා වැඳීමෙනි. උන් වහන්සේලාත් ආ පයින්ම පිටව ගියෝ ය.




කොල්වින් ආර් ද සිල්වා නොකියා කිව්වේ හාමුදුරුවන් කුල භේදය අනුව නිකාය බෙදීම ආගමට විරුද්ධ නේද කියන එක ය. පසු ගිය ලිපියේ සරත් ෆොන්සේකාට මහණ කම දීමට මල්වත්තේ නායක හාමුදුරුවන් අකැමැති බව මා කීවේත් ඔය නිසාවෙනි.

බෞද්ධයන් වන අපි සමානාත්මතාව කියලා දෙයක් ගැන කතා කරන්නෙමු. ප්‍රජාතන්ත්‍රවාදය තුළ ද උපතින් තීරණය වන භේදයක් නැත. එහෙවු ඒකේ අර මහනායක හිමිවරුන් ආරක්ෂා කරන්නට ඉදිරිපත් වූ ප්‍රජාතන්ත්‍රවාදය උන්වහන්සේලාගේ නිකායේත් තියෙන්නට විදියක් නැත. ගෙදරට මර ගාතේ කියන්නේ ඔන්න ඔහොම වෙලාවට ය. එහෙම කියා ගෙන ලෝකෙට කෙරෙන පරකාසේ ගණන් ගන්නා කෙනෙක් නැත.

කොහොමටත් මල්වත්තට වැරදිච්ච තැන ගැන තව ටිකක් විස්තර කීම අවශ්‍යමය. ඔය තත්වය උදාවූයේ කොහොමද කියන එක ලස්සන කතාවකි.

කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලය එන විට මහනුවර රජගෙදර තුළත් හින්දු බලපෑම් අධිකව පැවතියේ නායක්කාර් වංශිකයන් එහි මුල් බැස ගෙන තිබුණු නිසා ය. භික්ෂූන් කියා පිරිසක් නොසිටි තරම් ය. එවක සිවුරු දරා ගෙන සිටියවුන් හඳුන්වනු ලැබුවේ ද ගනින්නාන්සේ නමින් ය. ඔවුහු සිල් රැකීම වෙනුවට වයිවාරන්න යකැදුරුකම් බඳු කටයුතු වල නිරත වෙමින් සිටියහ. සිල්වත් භික්ෂූන් යයි කිව හැකි උදවිය සිටියේ අතළොස්සකි.

රජකම රැක ගැනීමට බෞද්ධ කම ඉදිරියට ගත් රජුන් සිටි එවක කීර්ති ශ්‍රී රාජසිංහ රජු ද සඟ සසුන නගා සිටුවනු වස් අර කියාපු විදියේ සිල්වත් භික්ෂුවක් වූ වැලිවිට සරණංකර හාමුදුරුවන් සියමට යවා උපසම්පදාව ලබා ගෙන ආපසු ගෙන්වා ගැනීම සියම් නිකායේ ආරම්භය විය. උන්වහන්සේට සංඝරාජ පදවිය පිරිනැමීමත් රජු කෙරේ බලපෑ හින්දු පැවතුම් අනුව වූවකැයි කිව හැකි ය.

සියම් නිකාය ගොවි කුලයට පමණක් සීමා වීම නිසා මුල පටන් ම එහි වැඩවසම් ස්වරූපයක් දක්නට ලැබිණ. එතැනත් ඉස්මතු වූයේ ශංකරාචාරීන්ගේ හින්දු ක්‍රමයයි. මෙවක මුහුදුබඩ පළාත් පාලනය කළ ලන්දේසිහු මේ තත්වය යොදා ගෙන බෞද්ධයන් ආගමට හරවා ගැනීමට තැත් කළහ. එහෙත් දකුණේ සාමාන්‍ය ජනතාව එයට අවනත නොවූ හ. කරාව, හලාගම කුල වල ජනයා වෙනුවෙන් වැලිතර ඤාණතිලක හිමියන් බුරුමයේ අමරපුරයට වැඩම කොට උපසම්පදාව ලබා ගෙන ආවේ මේ තත්වය ජයගනු පිණිස ය.

අමරපුර නිකාය තුළ පවා නොයෙක් කොටස් හා කුල අතර තවත් භේද හටගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් අමරපුර නිකායේම කොටස් අති වන්නට පටන් ගත්තේ ය. සමහර කොටසක කුලභේදයක් නොතිබුණත් උසස් තනතුරු දීමේ දී එක් කුලයක් බල පෑ බව පෙනිණ. වජිරාරාමයේ අධිපති කම ලැබූ නාරද හාමුදුරුවන් ජ්‍යෙෂ්ඨයා වුවත් ඒ නිකායේ මහනායක පදවිය නොලැබුණේ ඔය කුල ප්‍රශ්නය නිසා ය. එය ලැබුණේ මඩිහේ පඤ්ඤාසීහ හාමුදුරුවන්ට ය.

පසු කාලයේ අමරපුර නිකායේ කොටස් එකතු කරමින් පොදු නායකයකු පත් කර ගත් විට ඒ තනතුර හිමි වූයේ බලංගොඩ ආනන්ද මෛත්‍රිය මහ නා හිමියන්ටය. එහෙම වුණාට යටින් තිබුණු අර වෙනස්කම් මග හැරුණේ නැත.

ඔය අතරවාරයේ සමහර පන්සල් වලට විශ්ණු කතරගම දෙවිවරුන් වැද්ද ගැනීම නිසා කළකිරුණු කොටස් වෙනුවෙන් ඉදිරිපත් වූ අඹගහපිටියේ ඉන්ද්‍රාසභ හිමියෝ රාමඤ්ඤ දේශයට (ඒත් බුරුමයමය) වැඩම කොට ලැබූ උපසම්පදාව අනුව රාමඤ්ඤ නිකාය පිහිටුවූහ. අද බලනකොට කුල භේදයට යට නොවී පවතින එකම නිකාය එය පමණකි. මල්වත්ත මහනායක හාමුදුරුවන් ප්‍රමුඛ බලවත් භික්ෂූන් වහන්සේ ඉමහත් ශ්‍රද්ධාවකින් හා උද්‍යොගයකින් රැක ගන්නට කල්පනා කරපු ඔය කියන ප්‍රජාතන්ත්‍රවාදය සංඝ සමාජය තුළ දක්නට ලැබෙන්නේ යට කී රාමඤ්ඤ නිකායේ පමණක් බව උන්වහන්සේට දන්වා සිටින්නට තවත් කොල්වින් ආර් සිල්වා කෙනෙක් පහළ වෙත්වා. ■